AL/2024/19/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

**ජෛව සම්පත් තාක්ෂණවේදය I**
உயிர் வளத் தொழினுட்பவியல் I
Bio Resource Technology I

**19 S I**

*පැය දෙකයි*
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** මෘදු තාක්ෂණයේ මූලික ලක්ෂණ දෙකක් වන්නේ,
(1) නිර්මාණශීලීත්වය සහ නම්‍යශීලී බවයි.
(2) දෘඪ බව සහ ශක්තිමත් බවයි.
(3) සරලබව සහ දිගුකල් පැවැත්මයි.
(4) ලාභදායීබව සහ දෘඪ බවයි.
(5) නිරවද්‍යබව සහ ශක්තිමත් බවයි.

**2.** පැතුරුම්පත් (spread sheets) යෙදවුමේ ප්‍රාථමික කාර්යය වනුයේ
(1) ඉදිරිපත්කිරීම් නිර්මාණය කිරීමයි.
(2) ප්‍රස්තාර නිර්මාණය කිරීමයි.
(3) දත්ත විශ්ලේෂණය කිරීමයි.
(4) රූප සංස්කරණය කිරීමයි.
(5) ලේඛන සකස් කිරීමයි.

**3.** ආහාර පිරමීඩයක පාදස්ථය සමන්විත වන්නේ
(1) මේදය මගිනි.
(2) විටමින මගිනි.
(3) ප්‍රෝටීන මගිනි.
(4) කාබෝහයිඩ්‍රේට මගිනි.
(5) ජලය මගිනි.

**4.** ප්‍රෝටීන සහ කාබෝහයිඩ්‍රේට් සැලකිය යුතු ප්‍රමාණයෙන් ලබාදිය හැකි ආහාර ද්‍රව්‍යය වන්නේ
(1) මඤ්ඤොක්කා ය.
(2) කරවල ය.
(3) තිරිඟු ය.
(4) කැරට් ය.
(5) මුහුදු ඇල්ගී ය.

**5.** ආහාරවල එන්සයිමීය දුඹුරු පැහැගැන්වීම පාලනය කළ හැකි වන්නේ
(1) සෝඩියම් මෙටාබයිසල්ෆයිට් එකතු කිරීමෙනි.
(2) එහි සීනි ප්‍රමාණය අඩුකිරීමෙනි.
(3) ඒ වටා ඔක්සිජන් සාන්ද්‍රණය ඉහළ නැංවීමෙනි.
(4) කැල්සියම් ක්ලෝරයිඩ් එකතු කිරීමෙනි.
(5) එතිලීන් එකතු කිරීමෙනි.

**6.** සිල්ලර වෙළෙඳපොළ මට්ටමේ දී යාන්ත්‍රික හානි මගින් සිදුවන එළවළු නරක්වීම අවම කරන ප්‍රධාන ක්‍රියාමාර්ගය වන්නේ
(1) යහපත් පෙර අස්වනු තාක්ෂණයන් භාවිත කිරීමයි.
(2) යහපත් අස්වනු නෙළන ක්‍රමවේද හඳුන්වාදීමයි.
(3) ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් රසායනික පරිරක්ෂක යෙදීමයි.
(4) ආහාරවල ගුණාත්මය පිළිබඳව සිල්ලර වෙළෙඳුන්ගේ දැනුම දියුණු කිරීමයි.
(5) ඉහළ ගුණාත්මයෙන් යුත් පොලිසැක් කවර භාවිත කිරීමයි.

[දෙවැනි පිටුව බලන්න

**7.** ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය හොඳින් ම විස්තර කෙරෙන්නේ
(1) මාස කිහිපයක් සඳහා ප්‍රමාණවත් ආහාර නිවසේ ගබඩා කිරීම ලෙස ය.
(2) ගෘහස්ථ අවශ්‍යතා සඳහා සියලු ආහාර ගෙවත්තේ වගා කිරීම ලෙස ය.
(3) අර්බුද අවස්ථාවන්හි දී හදිසි ආහාර සැපයුම් කළමනාකරණය කරගැනීම ලෙස ය.
(4) පෝෂණ අගය නොසලකා සියලු අවස්ථාවල දී ප්‍රමාණවත් ආහාර පවත්වාගැනීම ලෙස ය.
(5) සැමවිට ම ආරක්ෂාකාරී සහ පෝෂ්‍යදායී ආහාර ප්‍රමාණවත් පරිදි ලබාගැනීමට ඇති ප්‍රවේශය තහවුරු කිරීම ලෙස ය.

**8.** පස පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පස යනු පෘථිවි පෘෂ්ඨය මත මීටර තුනක් පමණ උසට ඇති ද්‍රව්‍ය ස්තරයක් වේ.
(2) සුළඟ සහ ජලය මගින් විවිධ ද්‍රව්‍ය තැන්පත්වීමත් සමග පාංශු ජනනය සිදු වේ.
(3) ශාකයකට අවශ්‍ය සියලු ද්‍රව්‍ය පසෙහි අඩංගු නිසා එහි ශාක හොඳින් වර්ධනය වේ.
(4) හොඳ ගුණාත්මයෙන් යුත් කෘෂිකාර්මික පසක් නිවාස ඉදිකිරීමට ගන්නා පසකට සමාන වේ.
(5) සෞඛ්‍යමත් පසක් ශාක වර්ධනය සඳහා ස්ථාවර ජෛවීය පරිසරයක් ලබා දේ.

**9.** පරිසර පද්ධති සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පාරිසරික පිරමීඩයක පහළම ස්ථරය නියෝජනය කරන්නේ නිෂ්පාදකයින් ය.
(2) ස්වාභාවික පරිසර පද්ධතිවල ආහාරයට ගන්නා ස්වයංපෝෂී බිම්මල් අන්තර්ගත වේ.
(3) ශාකවලට වැදගත් පෝෂක ප්‍රභවයක් වන නයිට්‍රජන් සාගරවල බහුලව ඇත.
(4) පරිසර පද්ධතිවල ඇති අඩු ආර්ද්‍රතාවය සහ අඩු උෂ්ණත්වය කාබනික ද්‍රව්‍ය වියෝජනය පහසු කරවයි.
(5) පරිසර පද්ධතීන්, කාර්මික සහ ගෘහාශ්‍රිත අවශ්‍යතා සඳහා වන ප්‍රාථමික අමුද්‍රව්‍ය ප්‍රභව නොවේ.

**10.** ශාක ප්‍රචාරණය සඳහා පටක රෝපණය භාවිතයේ වාසියක් වනුයේ
(1) ඒ සඳහා සරල අඩු වියදම් උපකරණ අවශ්‍ය වීමයි.
(2) එමගින් ජානමය විවිධත්වයකින් යුත් ශාක නිෂ්පාදනය කිරීමයි.
(3) එමගින් ශාක ප්‍රචාරණය වසර පුරා කළ හැකි වීමයි.
(4) එය පාංශු තත්ත්වයන් මත රඳා පැවතීමයි.
(5) ඒ සඳහා පුහුණු ශ්‍රමය අවශ්‍ය නොවීමයි.

**11.** ශාක අත්තක් පොළවට නවා එහි අග්‍රස්ථය පිටතට සිටින සේ අත්තේ කොටසක් පස් මගින් වැසීම සිදු කරනු ලබන අතු බැඳීමේ ක්‍රමය හඳුන්වන්නේ
(1) වායව අතු බැඳීම ලෙස ය.
(2) ගොඩැලි අතු බැඳීම ලෙස ය.
(3) අග්‍රස්ථ අතු බැඳීම ලෙස ය.
(4) සරල අතු බැඳීම ලෙස ය.
(5) සංයුක්ත අතු බැඳීම ලෙස ය.

**12.** අතු බැඳීමේ තාක්ෂණයේදී මූල වර්ධනය ප්‍රවර්ධනය සඳහා බොහෝවිට භාවිත කරන හෝර්මෝනය වන්නේ
(1) ගිබරලින් ය. (2) ඔක්සින් ය.
(3) සයිටොකයිනින් ය. (4) එතිලීන් ය.
(5) ඇබ්සිසික් අම්ලය ය.

**13.** කසාය සඳහා සියලුම කොටස් භාවිතයට ගන්නා ඖෂධ ශාකය වන්නේ
(1) ඉඟුරු ය. (2) සැවැන්දරා ය. (3) මුරුංගා ය. (4) අරලු ය. (5) පාවට්ටා ය.

**14.** සෙවන ප්‍රියකරන ඖෂධ ශාකයක් වන්නේ
(1) අරලු ය. (2) බුළු ය. (3) නෙල්ලි ය.
(4) කිං කොහොඹ ය. (5) මුරුංගා ය.

**15.** ඖෂධ උද්‍යානවල යොදාගන්නා විශේෂ කළමනාකරණ ක්‍රමයක් වන්නේ
(1) ජල සම්පාදනයයි.
(2) කප්පාදු කිරීමයි.
(3) වල් නෙළීමයි.
(4) පළිබෝධ පාලනයයි.
(5) පොහොර යෙදීමයි.

**16.** කරදිය වගුරු බහුල, වෙරළ ආශ්‍රිත දිස්ත්‍රික්කය වන්නේ
(1) මන්නාරම ය. (2) ගම්පහ ය. (3) ත්‍රිකුණාමලය ය.
(4) අම්පාර ය. (5) වවුනියාව ය.

**17.** වියළීම මගින් ආහාර පරිරක්ෂණය සිදුවන්නේ
(1) වියළීමේ දී ඉහළ උෂ්ණත්වයට නිරාවරණය වීම නිසා ය.
(2) වියළීමේ ක්‍රියාවලිය තුළ දී ක්ෂුද්‍ර ජීවීන් විනාශවීම නිසා ය.
(3) ක්ෂුද්‍ර ජීවී වර්ධනයට අවශ්‍ය තෙතමනය අඩු නිසා ය.
(4) ආහාරවල දෘඪබව වැඩි වීම නිසා ය.
(5) වියළීමේ දී ප්‍රෝටීන විකරණයවීම නිසා ය.

**18.** 1996 දී නිපද වූ 'ඩොලී' නමැති බැටළුදෙන
(1) ජාන හුවමාරු තාක්ෂණයේ ප්‍රතිඵලයකි.
(2) ප්‍රතිසංයෝජිත DNA තාක්ෂණයේ ප්‍රතිඵලයකි.
(3) ක්ලෝන තාක්ෂණයේ ප්‍රතිඵලයකි.
(4) දෙමුහුම්කරණයේ ප්‍රතිඵලයකි.
(5) අභිජනන ක්‍රම කිහිපයක ප්‍රතිඵලයකි.

**19.** පුද්ගලයන් හතරදෙනකු සම්බන්ධ පහත විස්තර සලකා බලන්න.
A - මනා ලාභයක් උපයන, සමාගම් හිමිකරුවෙකු වන, ප්‍රධාන විධායක නිලධාරියෙක්
B - සාර්ථක නව ව්‍යාපාරයක් ආරම්භ කළ, ශක්තිමත් වෘත්තීය ආචාරධර්ම සහ මනා අනුවර්තනය වීමේ හැකියාවක් ඇති පුද්ගලයෙක්
C - අඩු වියදම් සහ කල් පවතින නව්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සොයාගෙන ඒවා වෙළෙඳපොළට සපයන තමාගේ ව්‍යාපාරයක් ආරම්භ කළ ප්‍රසිද්ධ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෙකුගේ පුත්‍රයෙක්
D - විදුලි සංදේශ සමාගමකට නව වෙනස්කම් හඳුන්වාදීමෙන් ලාභය වැඩි කළ, එම සමාගමට අලුතෙන් පත් කරන ලද කළමනාකරුවෙක්

ඉහත පුද්ගලයින් අතුරෙන් හොඳ ව්‍යවසායකයින් වනුයේ
(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම ය.

**20.** ආහාර සැපයීම, ව්‍යාපාරයක් ලෙස තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු සාධක කිහිපයක් වන්නේ
(1) තරගකරුවන්, ආහාරවලට ඇති ඉල්ලුම සහ භූමියේ සුලබතාවයයි.
(2) ප්‍රාග්ධන මූලය, යන්ත්‍රෝපකරණ අවශ්‍යතාවය සහ පොදු ප්‍රවාහන සේවයේ කාර්යක්ෂමතාවයයි.
(3) පුහුණු සහ නුපුහුණු කම්කරු සුලබතාවය, වෙළෙඳපොළ තත්ත්වය සහ අරමුදල්වල සුලබතාවයි.
(4) අපේක්ෂිත ලාභාංශය, රටෙහි දේශපාලන ස්ථාවරත්වය සහ ප්‍රදේශයේ ගෘහස්ථ ආදායමයි.
(5) යොදාගැනීමට බලාපොරොත්තු වන තාක්ෂණය, ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය සහ අධ්‍යාපන මට්ටමයි.

**21.** ව්‍යාපාරයක් සාර්ථකවීම සඳහා නිවැරදි කළමනාකරණයක් අවශ්‍ය වේ. ව්‍යාපාර කළමනාකරණ ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ

(1) ව්‍යාපාර ආකාරය තෝරාගැනීම වේ.
(2) පවතින සම්පත් හඳුනාගැනීම වේ.
(3) සුදුසු මානව සම්පත් සුලබතාවය තහවුරු කරගැනීම වේ.
(4) ව්‍යාපාරයේ අරමුණු සහ ඉලක්ක ස්ථාපනය කිරීම වේ.
(5) ක්‍රමෝපායන් සැලසුම් කිරීම වේ.

**22.** ව්‍යාපාර අවස්ථාවක් සඳහා මානව සම්පත් සැලසුම්කරණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වර්තමාන ශ්‍රම බලකාය සහ අනාගත අවශ්‍යතාවන් පළමුව තක්සේරු කළ යුතු ය.
(2) ආරම්භයේ දී ම තනතුරු සහ වැටුප් තීරණය කළ යුතු ය.
(3) ව්‍යාපාරයේ කටයුතු කරන සියලු ම පුද්ගලයින් නායකත්ව ගුණාංගවලින් යුක්ත විය යුතු ය.
(4) සියලු ම තනතුරු සඳහා පුහුණු පුද්ගලයන් පමණක් අනුයුක්ත කළ යුතු ය.
(5) සේවා නියුක්තිකයන්ගේ පවුල් සඳහා සුබසාධන වැඩපිළිවෙලක් ස්ථාපනය කළ යුතු ය..

**23.** ආහාර නිෂ්පාදනය සඳහා මෘදු තාක්ෂණයේ භාවිතය

(1) උසස් විද්‍යාත්මක සංකල්පයකි.
(2) යල්පැනගිය සංකල්පයකි.
(3) මහා පරිමාණ යොදාගැනීම් සඳහා පමණක් වැදගත් වේ.
(4) කුඩා පරිමාණ යොදාගැනීම් සඳහා පමණක් වැදගත් වේ.
(5) නවීන සමාජයට සහසම්බන්ධ වූ කොටසකි.

**24.** කසළ කළමනාකරණ ධූරාවලියේ නිවැරදි අනුපිළිවෙළ වන්නේ

(1) අඩුකිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, ප්‍රතිසාධනය සහ බැහැර කිරීම ය.
(2) අඩුකිරීම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතය, ප්‍රතිසාධනය සහ බැහැර කිරීම ය.
(3) නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, අඩුකිරීම, ප්‍රතිසාධනය සහ බැහැර කිරීම ය.
(4) ප්‍රතිසාධනය, අඩුකිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය සහ බැහැර කිරීම ය.
(5) ප්‍රතිසාධනය, අඩුකිරීම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතය සහ බැහැර කිරීම ය.

**25.** කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා වඩාත් බහුලව භාවිත කරන ක්‍රමය වන්නේ

(1) වින්ඩ්‍රෝ (windrow) ක්‍රමයයි. (2) නිර්වායු ක්‍රමයයි.
(3) චීන ක්‍රමයයි. (4) ඉන්දියානු ක්‍රමයයි.
(5) ශ්‍රී ලාංකීය ක්‍රමයයි.

**26.** ජෛව සම්පතක තිරසර බව නිර්ණය කරනු ලබනුයේ

(1) සුලභතාවය සහ ඒවායේ පරිභෝජන වේගයයි.
(2) සුලභතාවය සහ ඒවායේ වෙළෙඳපොළ අගයයි.
(3) ජනනයවීමේ වේගය සහ සුලභතාවයයි.
(4) ජනනයවීමේ වේගය සහ පරිභෝජන වේගයයි.
(5) ජනනයවීමේ වේගය සහ වෙළෙඳපොළ අගයයි.

**27.** පරිසර පද්ධතියක සෘජු මූලාශ්‍ර ක්‍රියාකාරිත්වය වනුයේ

(1) පරාගනයයි.
(2) පෝෂක චක්‍රීයකරණයයි.
(3) ජලය රඳවා තැබීමයි.
(4) ආහාර නිෂ්පාදනයයි.
(5) වාතය නියාමනයයි.

Past Papers Wiki



**28.** රතු දත්ත පොතෙහි අඩංගු වනුයේ
(1) ආක්‍රමණශීලී විශේෂවල ලැයිස්තුවකි.
(2) හායනය වූ වනාන්තරවල ලැයිස්තුවකි.
(3) තර්ජනයට ලක් වූ පරිසර පද්ධතිවල ලැයිස්තුවකි.
(4) තර්ජනයට සහ වඳවීමේ තර්ජනයට ලක් වූ විශේෂවල ලැයිස්තුවකි.
(5) අපනයනය තහනම් කළ සත්ත්ව හා ශාකවල ලැයිස්තුවකි.

**29.** ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වනාන්තරවල ස්වාභාවිකව දැකිය හැකි ශාක විශේෂයක් වනුයේ
(1) හොර (*Dipterocarpus zeylanicus*) ය.
(2) කීන (*Calophyllum calaba*) ය.
(3) මහ රත්මල් (*Rhododendron arboreum*) ය.
(4) මැහෝගනී (*Swietenia macrophylla*) ය.
(5) බුරුත (*Chloroxylon swietenia*) ය.

**30.** පහත ප්‍රකාශ සලකන්න.
A - වාණිජ වනවගා මගින් ජනතාවගේ දැව අවශ්‍යතාවය සපුරාලනු ලැබේ.
B - වාණිජ වනවගා මගින් ස්වභාවික වනාන්තරවලට ඇති පීඩනය අඩු කරනු ලැබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්
(1) A පමණක් නිවැරදි වේ.
(2) B පමණක් නිවැරදි වේ.
(3) A නිවැරදි වන අතර, B වැරදි වේ.
(4) A සහ B දෙකම නිවැරදි වන අතර, A මගින් B තවදුරටත් පැහැදිලි කරයි.
(5) A සහ B දෙකම නිවැරදි වන අතර, B මගින් A තවදුරටත් පැහැදිලි කරයි.

**31.** ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - පාරිසරික සංචාරක ප්‍රවර්ධනය දැඩි ස්වභාවික රක්ෂිත තුළ කළ නොහැක.
B - ස්වභාවික රක්ෂිත යනු ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රචලිත පාරිසරික සංචාරක උණුසුම් ස්ථානයන් ය.
C - වනජීවී සෆාරි යනු ප්‍රධාන පාරිසරික සංචාරක ක්‍රියාවකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ
(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ල ම ය.

**32.** ශ්‍රී ලංකාවේ රාජ්‍ය දැව සංස්ථාවේ වගකීමක් වන්නේ
(1) ස්වභාවික වනාන්තර සංරක්ෂණය කිරීමයි.
(2) ආරක්ෂිත ප්‍රදේශවල නැවත වගා කිරීමයි.
(3) රජය සතු වනාන්තරවලින් දැව ලබාගැනීමයි.
(4) විදේශ රටවලින් දැව ආනයනය කිරීමයි.
(5) දැවමය ගොඩනැගිලි ඉදිකිරීමයි.

**33.** දැවවල ඝනත්වය ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන්නේ ඒවායේ
(1) කල්පැවැත්ම සමග ය.
(2) සවිශක්තිය සමග ය.
(3) ගිනිගැනීම්වලට ඔරොත්තු දීම සමග ය.
(4) ජල ප්‍රතිරෝධීතාව සමග ය.
(5) වර්ණය සමග ය.

**34.** දැව පදම් කිරීම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකන්න.

A - දැව පදම් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ එහි භෞතික ලක්ෂණ සංරක්ෂණය කිරීමයි.

B - ඉරා නොමැති දැව සෘජුවම හිරු එළියේ වේළීම මගින් දැවවල ගුණාත්මය අඩු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් නිවැරදි වේ.
(2) B පමණක් නිවැරදි වේ.
(3) A සහ B දෙකම නිවැරදි වේ.
(4) A නිවැරදි වන අතර, B මගින් A තවදුරටත් පැහැදිලි කරයි.
(5) B නිවැරදි වන අතර, A මගින් B තවදුරටත් පැහැදිලි කරයි.

**35.** ශ්‍රී ලංකාවේ MDF බෝඩ් නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිත කරන ප්‍රධාන අමුද්‍රව්‍ය වනුයේ

(1) ලී කුඩු ය. (2) රබර් ලී ය. (3) පිදුරු ය.
(4) පරණ කඩදාසි ය. (5) උණ බම්බු ය.

**36.** වාෂ්පශීලී තෙල් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඒවා නිතැතින්ම ජලයට වඩා බර ය.
(2) ඒවා මධ්‍යසාරයේ අද්‍රාව්‍ය වේ.
(3) ඒවා දැඩි චිකිත්සක ගුණාංගවලින් යුක්ත ය.
(4) ඒවා ප්‍රධාන වශයෙන් පිසීමට භාවිත වේ.
(5) ඒවා ස්ථායි වන අතර කාලයත් සමග වෙනස් නොවේ.

**37.** පහත ප්‍රකාශ සලකන්න.

A - වල්කනයිස් කිරීම යනු ස්වභාවික රබර් හෝ ආශ්‍රිත බහු අවයවික, කල්පවතින ද්‍රව්‍යවලට පරිවර්තනය කිරීමේ රසායනික ක්‍රියාවලියකි.

B - වල්කනයිස් කිරීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන බහුඅවයවික වන්නේ ස්වභාවික රබර් සහ කෘත්‍රිම රබර් ය.

C - රබර් වල්කනයිස් කිරීමේ ක්‍රියාවලියේ දී සල්ෆර් සමග සක්‍රියකාරක ලෙස කැල්සියම් ඔක්සයිඩ් සහ ඇසිටික් අම්ලය භාවිත වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**38.** පහත දේ අතුරෙන් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කාබනික ද්‍රව්‍ය ශක්තිය, රසායනිකයන් සහ අනෙකුත් වටිනා නිෂ්පාදනවලට පරිවර්තනය කිරීමට ජෛව සම්පත් තාක්ෂණවේදයට හැකි ය.
(2) ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළෙහි ඇති යූරියා පොහොරවල 56% නයිට්‍රජන් අඩංගු වන අතර, එය වී වගාවේ දී වඩාත් බහුලව භාවිත වන පොහොර වේ.
(3) බෝග පාලනයේ ඇති වෙනස්කම් නිසා වල්පැළෑටි පාලනය සඳහා බෝග මාරුව ඵලදායී නොවේ.
(4) විවිධ බෝග වගා පද්ධතිවල ඇති බහු වාර්ෂික වල්පැළෑටි පාලනය සඳහා වඩාත් සුදුසු වන්නේ ස්පර්ශක වල්නාශකයි.
(5) ජල සැපයුමේ වේගය නිසා එළවලු වගාවක ඇති බොහෝමයක් කෘමි පළිබෝධ පාලනයට විසිරි ජල සැපයුම උපකාරී වේ.

**39.** දැව නොවන වනජ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා පූර්ණ වගකීම දරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංවිධානය වනුයේ

(1) තල් සංවර්ධන මණ්ඩලයයි. (2) පොල් සංවර්ධන මණ්ඩලයයි.
(3) අපනයන සංවර්ධන මණ්ඩලයයි. (4) කාර්මික සංවර්ධන මණ්ඩලයයි.
(5) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයයි.

[අනෙක් පිටුව බලන්න

**40.** හු දර්ශන පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - සත්වෝද්‍යානය නාගරික හු දර්ශනයකට උදාහරණයකි.

B - ශ්‍රී ලංකාවේ ස්වාභාවික හු දර්ශන දක්නට ලැබෙන්නේ ස්වභාවික රක්ෂිත තුළ පමණි.

C - ශ්‍රී ලංකාවේ උඩරට තේ වගාවක්, නවීකෘත හු දර්ශනනයක් ලෙස සැලකිය හැකි ය.

D - මින්නේරිය ජාතික වනෝද්‍යානය පාරිසරික හු දර්ශනයකට උදාහරණයකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ

(1) A, B සහ C පමණි.
(2) A, B සහ D පමණි.
(3) A, C, සහ D පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම ය.

**41.** ජෛව එතනෝල් නිෂ්පාදනය පිළිබඳ ව පහත ප්‍රකාශ සලකන්න.

A - ජෛව එතනෝල් නිෂ්පාදනය සඳහා ඇල්ගී භාවිත කරයි.

B - ඇල්ගීවල ඇති ලිපිඩ ජෛව එතනෝල් බවට පරිවර්තනය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් නිවැරදි වේ.
(2) B පමණක් නිවැරදි වේ.
(3) A සහ B දෙකම වැරදි වේ.
(4) A සහ B දෙකම නිවැරදි වන අතර, A මගින් B තවදුරටත් පැහැදිලි කරයි.
(5) A සහ B දෙකම නිවැරදි වන අතර, B මගින් A තවදුරටත් පැහැදිලි කරයි.

**42.** කිරි පැසවීම පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A - එළකිරිවලින් මුදවපු කිරි සහ යෝගට් නිෂ්පාදනය කිරීමේ ඒකක ක්‍රියාකාරකම් සෑම අතකින් ම සමාන වේ.

B - චීස් නිෂ්පාදනයේ දී ප්‍රථමයෙන් කිරි පැසවීමට ලක්කර පසුව රෙනට් මගින් කැටිගැසීම සිදුකරයි.

C - පැසවීමට ලක්කර නිපදවනු ලබන සියලු ම කිරි නිෂ්පාදනවල දී ලැක්ටෝස්, ලැක්ටික් අම්ලය බවට පත්කරනු ලබන්නේ එකම බැක්ටීරියා විශේෂ මගිනි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) B සහ C පමණි.

**43.** ශ්‍රී ලංකාවේ මුහුදු මාළු දිගු දුරක් ප්‍රවාහනය සඳහා වඩාත් සුදුසු පරිරක්ෂණ ක්‍රමය වනුයේ


(1) අධි ශීතනයයි. (2) දුම් ගැසීමයි. (3) ලුණු දැමීමයි.
(4) ශීතනයයි. (5) රික්ත ඇසුරුමයි.

**44.** අභිජනනයේ දී අඳුරු තත්ත්වයක් අවශ්‍ය වන මත්ස්‍ය විශේෂය වනුයේ

(1) නියොන්ටෙට්රා ය.
(2) තිලාපියා ය.
(3) චීන කාපයා ය.
(4) ඒන්ජල් ය.
(5) ගප්පි ය.

● ප්‍රශ්න අංක **45** ට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිත කරන්න.

**45.** රූපයේ දැක්වෙන ධීවර ආම්පන්නය වනුයේ



(1) හැඹිලි දැල ය.
(2) කරමල් දැල ය.
(3) විසි දැල ය.
(4) ට්‍රෝලර් දැල ය.
(5) මා දැල ය.

**46.** මිරිදිය බහුවිශේෂ මත්ස්‍ය පොකුණක පතුල් ස්ථරය සඳහා වඩාත් උචිත ජලජ විශේෂය වනුයේ
(1) ඉස්සන් ය. (2) කකුළුවන් ය.
(3) වේක්කයන් ය. (4) රිදී කාපයන් ය.
(5) කොයිකාපයන් ය.

**47.** ජලජීවී වගා පොකුණක ඇති ඇල්ගී ඝනත්වය නිර්ණය කිරීම සඳහා භාවිත කරන උපකරණය වනුයේ
(1) EC මීටරයයි. (2) pH මීටරයයි.
(3) සෙකි තැටියයි. (4) අන්වීක්ෂයයි.
(5) රිෆ්‍රැක්ටො මීටරයයි.

**48.** ශ්‍රී ලංකාවෙන් වැඩිපුරම අපනයනය කරනු ලබන විසිතුරු මත්ස්‍ය විශේෂය වනුයේ
(1) ප්ලේටි ය. (2) ගප්පි ය.
(3) කොයිකාපයන් ය. (4) ගුරාමි ය.
(5) ස්වෝර්ඩ්ටේල් ය.

**49.** ජලජීවී වගා පොකුණක අස්වැන්න නෙළීමෙන් පසු කළයුතු අත්‍යවශ්‍ය කාර්යය වනුයේ
(1) වාතනයයි.
(2) රොන්මඩ ඉවත් කිරීමයි.
(3) පොහොර යෙදීමයි.
(4) pH අගය සකස් කිරීමයි.
(5) වියළීමයි.

**50.** ශ්‍රී ලංකාවේ ප්‍රජා මූල සංවිධාන පිළිබඳව වඩාත් යෝග්‍ය ප්‍රකාශය වනුයේ
(1) සමෘද්ධි ව්‍යාපාරය, ප්‍රධාන ප්‍රජාමූල සංවිධානයකි.
(2) ප්‍රජාමූල සංවිධානයක ක්‍රියාකාරිත්වය සඳහා ව්‍යවස්ථාවක් අත්‍යවශ්‍ය නොවේ.
(3) තනිව ළඟාකර ගත නොහැකි ඉලක්කයක් සපුරාගැනීම සඳහා ප්‍රජාමූල සංවිධාන මගින් පුද්ගලයන් සවිබල ගන්වයි.
(4) ප්‍රජාමූල සංවිධාන මූලික වශයෙන් සංවිධානය වී ඇත්තේ පරිසර සංරක්ෂණ කටයුතු පිළිබඳ ව ක්‍රියාකිරීම සඳහා ය.
(5) ප්‍රජාමූල සංවිධානවල මූල්‍ය පාලනය සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පත්කළ භාණ්ඩාගාරිකවරයෙකු මගින් සිදු වේ.

* * *

000132

AL/2024/19/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

**ජෛව සම්පත් තාක්ෂණවේදය II**
உயிர் வளத் தொழினுட்பவியல் II
Bio Resource Technology II

**19 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ..................................

**උපදෙස් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් සහ ප්‍රශ්න **10**කින් සමන්විත වේ.

✳ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් **තුනකින්** සමන්විත වන අතර කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 9)**

✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

✳ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස සහ C කොටස — රචනා (පිටු අංක 10)**

✳ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.

✳ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

✳ ප්‍රශ්න පත්‍රයේ **B** හා **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංකය**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

0303000188110132

[දෙවැනි පිටුව බලන්න

## A - කොටස - ව්‍යුහගත රචනා

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **100** කි.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**1.** (A) පහත සඳහන් ප්‍රකාශ **සත්‍යය** නම් (√) ලකුණ ද **අසත්‍ය** නම් (X) ලකුණ ද සඳහන් කරන්න.

(1) කෘෂිකර්මාන්තයේ දී බිම් සැකසීම සඳහා සරල උපකරණ භාවිත කිරීම මෘදු තාක්ෂණවේදී යෙදීමකට උදාහරණයක් වේ. (..........)

(2) නව නිපැයුම් මෘදු තාක්ෂණයන් වේ. (..........)

(B) තොරතුරු තාක්ෂණයේ දී බහුලව භාවිත කරන සෙවුම් යන්ත්‍ර (search engine) **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

(C) ආහාරයක ඇති මහා පෝෂක සහ ක්ෂුද්‍ර පෝෂක මානව පෝෂණයේ දී සුවිශේෂී දායකත්වයක් දක්වනු ඇත. පහත පෝෂක අවශ්‍යතා සපුරාගැනීම සඳහා පරිභෝජනය කළ හැකි ප්‍රධාන ආහාර ප්‍රභවයක් බැගින් සඳහන් කරන්න.

| පෝෂකය | ප්‍රධාන ආහාර ප්‍රභවය |
|---|---|
| කාබෝහයිඩ්‍රේට | ........................................................................ |
| ප්‍රෝටීන | ........................................................................ |
| ලිපිඩ | ........................................................................ |
| විටමින් A | ........................................................................ |

(D) ආහාර අපවිත්‍රණය වීම නිසා නිරීක්ෂණය කළ හැකි වෙනස්කම් **හතරක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

(3) ....................................................................................................

(4) ....................................................................................................

(E) රටෙහි ආහාර සුරක්ෂිතතාවයට රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුව බලපාන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................


(F) නයිට්‍රජන් තිරකිරීමට අත්‍යවශ්‍ය වන මූල ගැටිතිවල දැකිය හැකි වැදගත් එන්සයිමය හා කනිකාව සඳහන් කරන්න.

(1) එන්සයිමය : ....................................................................................

(2) කනිකාව : ....................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(G) පහත සටහනේ දක්වා ඇති පටක රෝපණයේ A, B, C සහ D මගින් දක්වන පියවර හෝ තාක්ෂණ ක්‍රමය සඳහන් කරන්න.




(1) A ..........................................................................................

(2) B ..........................................................................................

(3) C ..........................................................................................

(4) D ..........................................................................................

(H) පටක රෝපණ ක්‍රමවේදයන්හි E පියවර සිදුකිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(I) ඖෂධීය ශාක වියළීමේ ක්‍රම **තුනක්** ලැයිස්තුගත කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

Q. 1

/100

000132
02030000188110132

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**2.** (A) ඖෂධීය කැඳවලට එක්කළ හැකි ධාන්‍යය වර්ගයක්, පත්‍ර වර්ගයක් සහ රයිසෝම වර්ගයක්, සඳහා උදහරණය බැගින් සඳහන් කරන්න.

(1) ධාන්‍යය වර්ගය : ............................................................

(2) පත්‍ර වර්ගය : ............................................................

(3) රයිසෝම වර්ගය : ............................................................

(B) ශ්‍රී ලංකාවේ කිවුල්දිය පරිසර පද්ධතීන් සඳහා උදාහරණ **දෙකක්** නම් කරන්න.

(1) ............................................................

(2) ............................................................

(C) පහත සඳහන් කෘෂි නිෂ්පාදනවල පසු අස්වනු හානි අවම කිරීමට බහුලව භාවිත කරන සංරක්ෂණ ක්‍රමයක් බැගින් ලියන්න.

(1) ගම්මිරිස්

............................................................

............................................................

(2) ගොරකා (*Garcinea*)

............................................................

............................................................

(3) නැවුම් එළවලු

............................................................


............................................................

(4) අල (අර්තාපල්)

............................................................

............................................................

(D) රූප සටහනේ දැක්වෙන සත්ත්ව සෛලයේ A සහ B මගින් දැක්වෙන කොටස් නම් කර, ඒ එක් එක් කොටසේ ප්‍රධාන කාර්යයක් ලියා දක්වන්න.




(1) A හි නම : ............................................................

(2) A හි ප්‍රධාන කාර්යය : ............................................................

(3) B හි නම : ............................................................

(4) B හි ප්‍රධාන කාර්යය : ............................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(E) ව්‍යාපාරයක අලෙවිකරණ සැලසුම නිර්මාණයේ පියවර **හතර** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

(F) පැළ තවානක් සම්බන්ධයෙන් තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත.

| | |
|---|---|
| භූමියේ වටිනාකම | රු. 5 000 000 |
| වාහනවල වටිනාකම | රු. 4 000 000 |
| ජල පොම්පයේ හා උපකරණවල වටිනාකම | රු. 200 000 |
| බඳුන් ගතකළ පැළවල වටිනාකම | රු. 500 000 |
| ගබඩාකර ඇති පොහොරවල වටිනාකම | රු. 100 000 |
| වසර 4 ක් තුළ ගෙවිය යුතු බැංකු ණය | රු. 2 000 000 |
| ගෙවිය යුතු උපයෝගිතා බිල්පත් | රු. 50 000 |
| වාර්ෂික සාමාන්‍යය ආදායම් බද්ද | රු. 40 000 |

පහත දෑ ගණනය කරන්න.

(1) මුළු ස්ථාවර වත්කම්හි අගය:

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(2) මුළු ජංගම වත්කම්හි අගය:

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

000132

01030001881 10132

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(3) මුළු ජංගම වගකීම්වල වටිනාකම:

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(4) මුළු ජංගම නොවන වගකීම්වල වටිනාකම:

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(G) පහත සඳහන් ප්‍රකාශ **සත්‍යය** නම් (√) ලකුණ ද **අසත්‍ය** නම් (X) ලකුණ ද සඳහන් කරන්න.

(1) කර්මාන්තයක සාර්ථකත්වය රඳාපවතිනුයේ මෘදු හා දෘඪ තාක්ෂණයන්හි උචිත සංයෝජන මතය (........)

(2) විසිරි ජල සම්පාදන පද්ධතිය දෘඪ තාක්ෂණයට උදාහරණයක් වුව ද, එම පද්ධතියේ කළමනාකරණය මෘදු තාක්ෂණයට උදාහරණයක් වේ. (........)

(H) කොම්පෝස්ට් මිශ්‍රනයක පොටෑසියම් හා පොස්පරස් ප්‍රමාණය වැඩිදියුණු කරන ද්‍රව්‍යයන් එකක් බැගින් නම් කරන්න.

(1) පොටෑසියම් : ..............................................................................

(2) පොස්පරස් : ..............................................................................

Q. 2

100

3. (A) පහත සඳහන් ජෛව සම්පත්වල ඇති ප්‍රධාන හිතකර ද්‍රව්‍යය නම් කරන්න.

(1) කොම්පෝස්ට්: ..............................................................................

(2) මී පැණි : ..............................................................................

(B) ස්ථානීය නොවන සංරක්ෂණය ජෛව විවිධත්ව සංරක්ෂණයේ දී භාවිත කරනු ලබන එක් තාක්ෂණික ක්‍රමයක් වේ. ලෝකයේ භාවිත කරනු ලබන ස්ථානීය නොවන සංරක්ෂණ ක්‍රම **හතරක්** නම් කරන්න.

(1) ..............................................................................

(2) ..............................................................................

(3) ..............................................................................

(4) ..............................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(C) කඳුකර වනාන්තර යනු ශ්‍රී ලංකාවේ පවතින එක් වැදගත් වනාන්තර වර්ගයක් වේ. ශ්‍රී ලංකාවේ හමුවන කඳුකර වනාන්තර **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(D) බහු ස්ථර වගා පද්ධතියක වාසි **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

(1) ..........

(2) ..........

(E) සාගරයෙන් තිරසරව ලබාගත හැකි ජෛව සම්පත් සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.

(1) ..........

(2) ..........

(F) ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන පාරිසරික සංචාරක කර්මාන්තයන් සඳහා ජනප්‍රිය ගමනාන්තය බැගින් ලියන්න.

(1) ස්වාභාවික පරිසර ත්‍රාසජනක සංචාරක කර්මාන්තය : ..........

(2) සංස්කෘතික සංචාරක කර්මාන්තය : ..........

(G) දැව කර්මාන්තය ශ්‍රී ලංකාවේ වැදගත් ප්‍රාථමික කර්මාන්තයක් වේ.

(i) ප්‍රධාන වශයෙන් වැවිලි කෘෂිකර්මාන්තය තුළින් ලබාගන්නා දැව වර්ග **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(ii) ශ්‍රී ලංකාවේ වනාන්තරවලින් දැව ලබාගැනීමට සෘජුවම අදාළ වන නීතියක් හෝ රෙගුලාසියක් සඳහන් කරන්න.

..........

(iii) දැව පරිරක්ෂණයේ වාසි **තුනක්** ලියන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(H) ස්වාභාවික වනාන්තරවලින් ලබාගැනීම නීත්‍යානුකූලව සීමාකර ඇති දැව නොවන වනජ සම්පත් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(I) ශාක ද්‍රව්‍යවලින් විවිධ සංඝටක නිස්සාරණයට භාවිත කරන ක්‍රමවේද **තුනක්** ලැයිස්තු ගත කරන්න.

(1) ..........

(2) ..........


(3) ..........


Q. 3

/100

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**4.** (A) තනි ඉස්කුරුප්පු තෙල් හිඳින යන්ත්‍රයක ව්‍යුහයක් පහත දැක්වේ. A හා B කොටස් නම් කරන්න.






A - ..................................................................................................

B - ..................................................................................................

(B) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අඛණ්ඩ බෝගවගාව සම්බන්ධ පාරිසරික ගැටලු **දෙකක්** ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(C) පාරිසරික භූ දර්ශනයක අත්‍යවශ්‍ය ගතිලක්ෂණ **දෙකක්** ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(D) ගෝලීය උණුසුම අවම කිරීම සඳහා උපාය මාර්ග **දෙකක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(E) යීස්ට් මගින් කාබෝහයිඩ්‍රේට පැසවීමේ ප්‍රධාන අන්තඵල **දෙක** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(F) මුහුදේ මසුන් ඇල්ලීමේ දී භාවිත කරන සක්‍රීය ධීවර ආම්පන්න **දෙකක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(G) ආහාරමය මත්ස්‍ය වගාවේ දී භාවිතා කරන විවිධ ව්‍යුහ **තුනක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(H) ජලජීවී වගාව සිදුකළ හැකි ස්වාභාවික ජල ප්‍රභව වර්ග **තුනක්** ලැයිස්තුගත කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(I) ජලජීවී වගා පොකුණක ජලයේ ගුණාත්මය පවත්වා ගැනීම සඳහා අධීක්ෂණය කළ යුතු පරාමිතීන් **තුනක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(J) මව් සතුන් නිසි පරිදි තෝරා නොගැනීම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අභිජනන ඒකකයක නිරීක්ෂණය කළ හැකි අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

..........................................................................................

(2) ..........................................................................................

..........................................................................................

(K) ප්‍රජා මූලික සංවිධාන බිහිකළ හැකි ජෛව සම්පත් ආශ්‍රිත ක්ෂේත්‍ර **දෙකක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

Q. 4

$\overline{100}$

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ජෛව සම්පත් තාක්ෂණවේදය II
உயிர் வளத் தொழினுட்பவியல் II
Bio Resource Technology II

**19 S II**

## රචනා

* **B** සහ **C** යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු **150** බැගින් හිමි වේ.

## B කොටස

**5.** (i) කෘෂිකර්මාන්තයේදී තාක්ෂණය අනුචිත අයුරින් භාවිත කිරීමේ අවදානම සහ භයානකබව පිළිබඳ කෙටි රචනයක් ලියන්න.

(ii) ව්‍යාපාරයක් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක වැදගත්කම ලියන්න.

(iii) හෘද රෝග සඳහා අධිපෝෂණයේ බලපෑම විස්තර කරන්න.

**6.** (i) ආහාර නරක්වීම නිසා සිදුවිය හැකි හානි විස්තර කරන්න.

(ii) ශාකවල ලිංගික ප්‍රචාරණයේ ප්‍රධාන වාසි හා අවාසි විස්තර කරන්න.

(iii) තිරසර ජල පරිසර පද්ධතියක පැවැත්ම සඳහා ඇති තර්ජන විස්තර කරන්න.

**7.** (i) වගා කිරීමට සුදුසු බෝග තේරීමේදී කෘෂි පාරිසරික කලාපවල වැදගත්කම පැහැදිලි කරන්න.

(ii) ජීවවායු ඒකකයක ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවන් සඳහා බලපාන සාධක විස්තර කරන්න.

(iii) කුඩා ග්‍රාමීය කර්මාන්තයක භාණ්ඩ තොග පවත්වා ගැනීමේ ලේඛන සඳහා මෘදුකාංගයක් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න.

## C කොටස

**8.** (i) වාණිජ වනවගාවල භාවිත විස්තර කරන්න.

(ii) සුදුසු ශාක ප්‍රභවවලින් දියර පොහොර නිෂ්පාදනයේ දී භාවිත කළ හැකි ක්‍රම විස්තර කරන්න.

(iii) විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමේ දී සලකා බැලිය යුතු වැදගත් සාධක විස්තර කරන්න.

**9.** (i) පාරිසරික සංචාරක ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී අනුගමනය කළයුතු ප්‍රධාන පියවර කෙටියෙන් විස්තර කරන්න.

(ii) දැව රසායනික පරිරක්ෂණයේ වැදගත් පියවර විස්තර කරන්න.

(iii) පල්කිරීමේ ක්‍රියාවලිය විස්තර කර, පරිසරයට එහි ඇති ඍණාත්මක බලපෑම සඳහන් කරන්න.

**10.** (i) වෙරළබඩ කළපුවලින් මත්ස්‍ය සම්පත් තිරසරව ලබාගන්නේ කෙසේදැයි සුදුසු උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ බලශක්ති අර්බුදයට විසඳුමක් ලෙස ජෛව සම්පත් භාවිතාකළ හැක්කේ කෙසේදැයි විස්තර කරන්න.

(iii) පාසලක් සඳහා භූ දර්ශන සැලසුමක් නිර්මාණයේ දී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක කෙටියෙන් විස්තර කරන්න.

* * *